**ජාතික විද්‍යා පදනම -   2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික විද්‍යා පදනමේ (''පදනම'') 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවමත් භාවිතයේ පවතින පිරිවැය වටිනාකම රු.94,525,117 ක් වූ වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරනය කර නොතිබුණි. එසේම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව මෙම වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කිරීම දැනටමත් සිදු කරගෙන යනු ලබයි. ක්ෂය කිරීම් අවසන් වත්කම් නැවත සමාලෝචනය කිරීම මේ වර්ෂය තුළ නිම කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 07 ඡේදය ප්‍රකාරව මෘදුකාංග වර්ග 03 ක බලපත්‍ර අලුත් කිරීමේ දී ඉදිරි වර්ෂවල වියදම් ද සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගෙන තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු.428,819 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණයට එකඟ වන අතර කාල පරිච්ඡේද හා අගයන් අනුව වැඩියෙන් දක්වා ඇති මුදල රු.428,819 වේ. අදාළ නිවැරදි කිරීම 2023 මැයි 22 සිදුකර ඇත. | -එම- |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9 හි 35 ඡේදය ප්‍රකාරව පදනම විසින් තොග පිරිවැය හදුනා ගැනීම සඳහා ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය භාවිතා කරන බව ප්‍රතිපත්ති මඟින් හෙළිදරව් කර තිබුන ද ගබඩාව මගින් තොග නිකුත් කිරීමේ දී එම ප්‍රතිපත්තියෙන් පරිබාහිරව කටයුතු කර ඇති අවස්ථා පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රකාශන පිරිවැය වූ රු.2,662,612 ක වටිනාකම ආයතනය විසින් රු.2,572,118 ක් ලෙස | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. ප්‍රායෝගිකව තොග නිකුත් කිරීමේ දී ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමවේදය අනුගමනය කර ඇති නමුත් ඒවා ගිණුම් ගත කිරීමේ දී ක්‍රමවේදයෙන් බැහැර වූ අවස්ථා කීපයක් වන අතර ඒවා නිවැරැදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම |

හඳුනාගෙන ඇති බවත් ඒ හේතුවෙන් පිරිවැය රු.90,494 ක් අඩුවෙන් සටහන් වී තිබුණි.

### 1.5.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ 4 වන වගන්තිය | සංචිත වාහන පාලනය කිරීම හා නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් පද්ධති පාලනයන් හා ක්‍රමවේදයන් පවතින බවට හා පිරිවැය පිළිබඳව සැලකිලිමත් වන බවට ඉහළ කළමණාකාරීත්වය වගබලා ගනිමින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සලසා දීම සිදුකළ යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී කණ්ඩායම් ප්‍රවාහනය සඳහා රු.826,044 ක් ගෙවා තිබුණි. | 2022 වර්ෂයේ මැද භාගයේදී සිට කණ්ඩායම් ප්‍රවාහනය සඳහා කුලී රථ භාවිතය සම්පූර්ණයෙන් නතර කර කණ්ඩායම් ප්‍රවාහන පහසුකම ලබා දීමද සතියකට දවස් 02 ක් ලෙස අඩුකරන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 5කට වැඩි රු.2,045,055 ක් හා වසර 2කට වැඩි රු.823,540 ක් ලෙස එකතුව රු.2,868,595 ක් වූ ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රු. 2,045,055 ක මෙම ණය හිමි ශේෂය කුරුඳු ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දුන් සුළු පරිමාණ කර්මාන්ත අමාත්‍යාංශයට පියවිය යුතු ව ඇත. මෙම ව්‍යාපෘතියට අදාළ පර්යේෂණ 05 න් එක් ප්‍රදානයක අවසන් වියදම් වාර්තාව ලැබීමට නියමිත අතර එය ලද වහාම, ආයතනයන් අතර වියදම් සැසඳීමෙන් පසු ඉතිරි මුදල් පියවීමට පියවර ගනු ලැබේ.<br>රු.843,540 ක මෙම ශේෂය Covid 19 පර්යේෂණ සඳහා ලද පරිත්‍යාග මුදලක් වන අතර එහි අවසන් වියදම් වාර්තාව ලද විගස ඉතිරි මුදල පියවීම හෝ ආයතනයේ වෙනත් ව්‍යාපෘති සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.38,548,294 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,722,038 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,826,256 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රාග්ධන ප්‍රදාන රු.45,672,900 කින් අඩු වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනික පරිපාලනමය ක්‍රියාපටිපාටියක සිදු වූ වැරදි තීරණ මත පදනමේ නිළධාරිනියන් දෙදෙනකු හට 2014 ජූලි 21 දින ගිණුම් නිළධාරි තනතුර සඳහා පත්වීමේ ලිපි නිකුත් කළද, පසුව එම පත්වීම් අවලංගු කිරීම හේතුවෙන් අදාල පාර්ශවය විසින් කොළඹ බේරුම්කරුගේ අංශය හා කාර්මික අධිකරණයේ කරන ලද පැමිණිල්ලට ලබා දුන් තීරණ අනුව පත්වීම දීමට එකඟ වු නිසා ඒ සඳහා දරන ලද නීති ගාස්තු වූ රු.130,000 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | ගිණුම් නිලධාරීන්ගේ ගැටළුව අභ්‍යන්තරව විසදා ගැනීමට 2014 සිට උත්සාහ කලද සාර්ථක නොවීම නිසා දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ගොනුකර තිබූ පැමිණිල්ල විභාග කිරීම ආරම්භ කල අතර, මෙම නඩුවට ආයතනය වෙනුවෙන් පෙනී සිටීමට සුදුසු නිලධාරියෙකු නොසිටි බැවින් කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය මත නීතිඥ මහතෙකුගේ සේවය ලබා ගෙන ඒ සඳහා රු.130,000/- නීති ගාස්තු ගෙවන ලදී. | කළමණාකරන තීරණ ගැනීමේදී කාර්යක්ෂම හා ඵලදායී අයුරින් කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සෞඛ්‍ය විද්‍යා පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුමේ 2.4 ජේදය ප්‍රකාරව ව්‍යාපෘතිය නිමකර මසක් ඇතුලත ඉතිරි මුදල් පියවිය යුතු වුවත් ව්‍යාපෘති 04 කට අදාළව එකතුව රු.3,891,870 ක් වූ ඉතිරි මුදල් පියවීමට පර්යේෂකයන් කටයුතු කර නොතිබුණි. | RPHS/2016/DTM 02, CKDu 03 , CKDu 05 සහ CKDu 07 හි ඉතිරි මුදල් පියවිය යුතුය. | ගිවිසුමේ 2.4 ප්‍රකාරව ව්‍යාපෘතිය නිමකර මසක් ඇතුලත ඉතිරි මුදල් පියවීමට හැකි වන පරිදි පාලන ක්‍රම වැඩි දියුණු කළ යුතුය. |
| (ආ) අවශ්‍යතාව නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව මුදල් ප්‍රතිපාදන ලබා දීම හේතුවෙන් සෞඛ්‍ය විද්‍යා පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘති 02කට අදාළව ලබා දෙන ලද එකතුව රු.මිලියන 10ක මුදලින් රු. මිලියන 08 ක මුදලක් වර්ෂයකට ආසන්න කාලයක් පර්යේෂණ ව්‍යාපෘති තුළ නිෂ්ක්‍රීයව තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. අරමුදල් පිළිබඳ බාධාවන් පැවතීම නිසා RPHS / 2016/ CKDu / 01 පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා RPHS / 2016/ DTM / 01 ව්‍යාපෘතියේ අරමුදල් භාවිතා කරමින් ව්‍යාපෘතිය කරගෙන යන ලදී. RPHS/ 2016/ CKDu /03 ව්‍යාපෘතිය යටතේ මුල් මාස 6 කාලය තුළ බලමුලු ගැන්වීමේ කටයුතු සිදුකළ බැවින් ශ්‍රමය සඳහා ගෙවීම් කිරීම පමණක් සිදුකර තිබුණි. | ලබා දුන් ප්‍රතිපාදන භාවිතා කර නොමැති නම් සාධාරණ කාලයක් ඇතුළත නැවත ලබා ගැනීමට හැකි පරිදි පාලන ක්‍රම අනුගමනය කළ යුතුය. |